**ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය**

කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070

විද්‍යුත් තැපැල: shenjy@state.gov http://srilanka.usembassy.gov


නිවේදන අංක: 20170220

**එක්සත් ජනපද මන්ත්‍රී මණ්ඩල නියෝජිත පිරිස**
**එක්සත් ජනපද - ශ්‍රී ලංකා සබඳතා ශක්තිමත් කරයි**

**කොළඹ, පෙබරවාරි 20:** තුන් දින සංචාරයක් සඳහා එක්සත් ජනපද නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රී මණ්ඩල ප්‍රජාතන්ත්‍රික හවුලේ (HDP) ද්වි-පාත්ෂික නියෝජිත පිරිසක් අද කොළඹට පැමිණේ. 2016 සැප්තැම්බර් 14 වැනිදා වොෂින්ටනයේ දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව හා එක්සත් ජනපද නියෝජිත මන්ත්‍රී මණ්ඩලය අත්සන් කළ සහයෝගිතා ගිවිසුමෙන් ආරම්භ වූ මෙම වැදගත් හවුල් සබඳතාව දිගටම පවත්වා ගෙන යෑමට මෙම නියෝජිත පිරිස අපේක්ෂා කරයි. එක්සත් ජනපද කොංග්‍රසයේ ශ්‍රී ලංකාවට ඇති ද්වි පාක්ෂික සහයෝගය මෙම සංචාරයෙන් අවධාරණය කෙරේ.

“අපේ රටේ කොංග්‍රස් සභාවේ තෝරා පත් කර ගත් නියෝජිතයන්ගේ මෙම සංචාරය, එක්සත් ජනපද- ශ්‍රී ලංකා සබඳතාවලට එක්සත් ජනපද රජයේ සියලුම අංශවල ද්වි-පාක්ෂික සහයෝගය පෙන්වන“ බව ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති අතුල් කෙෂාප් ප්‍රකාශ කළේය.

මෙම සංචාරය තුළදී නියෝජිත පිරිස ජනාධිපති, අගමැති. විදේශ ඇමති, පාර්ලිමේන්තුවේ කථානායක, විවිධ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හා සිවිල් සමාජ සාමාජිකයන් ආදීන් හමුවනු ඇත. මෙම නියෝජිත පිරිසේ නායකයා වන්නේ මන්ත්‍රී මණ්ඩල ප්‍රජාතාන්ත්‍රික හවුලේ (HDP) සභාපති කොංග්‍රස් සභික පීටර් රොස්කාම් ( රිපබ්ලිකන්-ඉලිනොයි) වන අතර අනිත් සාමාජිකයන් වන්නේ කොංග්‍රස් සභික ඩේවිඩ් ප්‍රයිස් (ඩිමොක්‍රැට් - උතුරු කැරොලිනා), කොංග්‍රස් සභික ගුවෙන් මුවර් (ඩිමොක්‍රැට් - විස්කොන්සින්), කොංග්‍රස් සභික ඒඩ්‍රියන් ස්මිත් (රිපබ්ලිකන්-නෙබ්‍රස්කා), සහ කොංග්‍රස් සභික ජෙරී කොනලි (ඩිමොක්‍රැට්- වර්ජිනියා) ය.

මන්ත්‍රී මණ්ඩල ප්‍රජාතාන්ත්‍රික හවුල (HDP) එක්සත් ජනපද නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ද්වි-පාක්ෂික සාමාජිකයන් විසිදෙනෙකුගෙන් සමන්විත කොමිසමකි. එය ඵලදායී, ස්වාධීන හා ප්‍රතිචාරී ව්‍යවස්ථාදායක ආයතන සංවර්ධනය කිරීමට ලොව පුරා ඇති හවුල්කාර රටවල් සමග කෙළින්ම කටයුතු කරයි. මෙම (HDP) හවුල පිළිබඳ වැඩි විස්තර https://hdp.house.gov/ යන වෙබ් අඩවියෙන් ලබා ගත හැකියි.